ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව
---------------------------------------------
මාතලේ දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ලග්ගල-පල්ලේගම ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පරිත්‍යාග ලෙස ලැබුණු යන්ත්‍ර උපකරණ වටිනාකම රු.2,801,950 ක් හා ලීබඩු වටිනාකම රු.532,385 ක එකතුව වූ රු.3,334,350 ක් අදාළ වත්කම් ගිණුම් වලට හර කර හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම බැර කර නැවතත් අවිනිශ්චිත ගිණුමට හර කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | කර්මාන්ත ණයහිමි වටිනාකම රු.247,605 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේදි පහත සඳහන් තැන්පතු ලැබීම් වල එකතුව රු.210,923 ක් වුවත් රු.84,375 ක් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන් ගෙවිය යුතු තැන්පත් ගිණුම රු.134,248 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (viii) | පෙර වර්ෂයට හෝ සමාලෝචිත වර්ෂයට අදාළ නොවන ආදායම් වශයෙන් රු.14,811 ක් ලැබිය යුතු පොලි ගිණුමට හර කර සමුච්චිත අරමුදලට බැර කර තිබිම හේතුවෙන් ලැබිය යුතු පොලි ගිණුම හා සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (ix) | මූල්‍ය ප්‍රකාශන තුළ ඇති ඇතැම් ජර්නල් සටහන් ලෙජර් ගිණුම් සමඟ පරික්ෂා කර බැලීමේදී තනි සටහනක් පමණක් ලෙජර් ගිණුම්වලට ගලපා තිබීම හේතුවෙන් වත්කම් වශයෙන් රු.148,679 ක් හර කර වගකීම් වශයෙන් රු.4,042,266 ක් බැර කර තිබිම හේතුවෙන් සමස්ථයක් ලෙස වගකීම් රු.3,893,587 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි ජර්නල් සටහන් ඉදිරිපත් කර ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (x) | ලග්ගල ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂයේ පොලිය රු.203,197 ක් ලැබිය යුතු පොලි ගිණුමට හර කළ යුතු වුවත් එම ගිණුමට බැර කිරිම හේතුවෙන් රු.406,394 ක් ලැබිය යුතු පොලී ගිණුමේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (xi) | ජර්නල් සටහන් 21 මගින් ලැබිය යුතු පොලී ගිණුම රු.210,000 කින් හර කර ඇතත් එම ජර්නල් සටහන සම්බන්ධව කිසිදු තොරතුරක් ඉදිරිපත් නොකිරිම නිසා එම වටිනාකම කුමක්ද යන්න නිශ්චය කළ නොහැකි වී තිබුණි. | ජර්නල් සටහන් වගකිමකින් ඉදිරිපත් කර ගිණුම නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.33,506,079 ක් වූ ගිණුම් විෂයන් 15 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.5,435,970 ක අසමානතාවයක් නිරීක්ෂණය විය. | අදාළ ගිණුම් ශේෂ උපලේඛන සමඟ සසඳා වෙනස්කම් නිවැරදි කළ යුතුවේ. | පිලිතුරු ලබාදී නොමැත. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.243,120 ක් වූ අතර එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ශේෂය ඇතිවීමට හේතු සොයා නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.27,616,455 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය | පෙන්වා දී ඇති ලේඛන සකස් කර ඉදිරියේදි විගණනය වෙත ඉදිරිපත් කරන බව දන්වා ඇත. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | මාස 06 ක් ඉක්ම වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ 396 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නීති රීති රෙගුලාසි අනුව නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV(3.5) වගන්තිය | ආපදා ණය ගෙවීමේදී ශේෂ වැටුප අවකරණ වලින් පසු 40% කට නොවැඩි විය යුතු වුවද ඊට අනුකූල නොවී නිලධාරින් 05 දෙනෙකු සඳහා ආපදා ණය ගෙවීම් කර තිබුණි. | ආයතන සංග්‍රහයට අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි ණය ගෙවිමේදී ආයතන සංග්‍රහයට අනුව කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(1) අනු රීතිය** | **ටෙන්ඩර් මණ්ඩලය ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් පත්කල යුතු බවත් එසේ නොමැති නම් සභාව හා මුදල් කමිටුවට ටෙන්ඩර් මණ්ඩලය ලෙස කටයුතු කළ හැකි බව දක්වා තිබුණද සභාවේ යෝජනා සම්මතයක් මඟින් මහා සභාව ටෙන්ඩර් මණ්ඩලය වශයෙන් පත්කර නොතිබුණි.** | **ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුවේ.** | **ඉදිරියේදි ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කරන බව දන්වමි.** |
| (ඇ) | **2008 දෙසැම්බර් 31 දිනැති අංක 2008/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | **ආපදා ණය ගෙවීම උපරිමය රු.250,000 ක් බව දක්වා තිබුණද එක් නිලධාරියෙකු සඳහා රු.300,000 ක් ගෙවීම් කර තිබුණි.** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුවේ.** | **චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරන බව දන්වමි..** |

1.4.2 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 1914/40 හා 2015 මැයි 15 දිනැති ගැසට් පත්‍රය IV(අ) වගන්තිය ප්‍රකාරව සභාවේ අවසරය නොලබා දීමනා ගෙවීමට අදාළ මාසයේ සභා රැස්වීම් වලට සහභාගි නොවූ සභිකයින්ට සභික දීමනා සඳහා හිමිකම් නොලබන බව දක්වා තිබුණද එසේ රැස්වීම් සඳහා සහභාගි නොවූ සභිකයින් 11 දෙනෙකු සඳහා රු.165,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි.** | **ගැසට් නිවේදනය අනුව කටයුතු කර ගෙවීම් කිරීම කළ යුතුවේ.** | **සභිකයින් සහභාගී නොවන බව සභාපති වෙත දුරකථනයෙන් දැනුම් දී තිබෙන බව දන්වමි.** |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,567,646 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.659,500 ක් විය.**

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලග්ගල ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.500,000 ක් වූ ස්ථාවර තැන්පතු ගිණුමෙන් 2019 වර්ෂයේදි රු.200,000 ක් හා එදිනට පොලිය වූ රු.118,036 ක් මුදල් කර සභාවේ කටයුතු සඳහා යොදාගෙන තිබුණද ඒ සඳහා මහසභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | මහා සභා අනුමැතිය ලබාගත යුතුවේ. | ඉදිරි මහා සභාවකට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) එකතුව රු.115,090 ක් වූ සභාවට අයත් අක්‍රීය ජංගම බැංකු ගිණුම් 02 ක් අහෝසි කොට සහා අරමුදලට බැරකර ඇතත් ඊට මහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මහා සභා අනුමැතිය ලබාගත යුතුවේ. | ඉදිරි මහා සභාවකට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නිවැරදි කරන බව දන්වමි.. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 538,250 | 837,412 | 435,843 | 401,569 | 705,056 | 169,107 | 302,956 | 861,151 |
| කුලී | 68,600 | 297,470 | 296,820 | 650 | 41,600 | 54,190 | 39,770 | 14,420 |
| බලපත්‍ර ගාස්තු | 525,000 | 401,981 | 385,231 | 16,750 | 250,000 | 322,800 | 322,800 | - |
| වෙනත් ආදායම් | 1,800,000 | 2,679,349 | 1,204,562 | 1,474,787 | 2,800,000 | 1,723,353 | 913,155 | 810,198 |
| එකතුව | 2,931,850 | 4,216,212 | 2,322,456 | 1,893,756 | 3,796,656 | 2,269,450 | 1,578,681 | 1,685,769 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | 2019 වර්ෂය අවසාන වන විට වරිපනම් බදු සහ වෙනත් ආදායම් අයකිරීම ප්‍රගතිය දුර්වල වී තිබුණු අතර 2019 වර්ෂයට අදාළ ආදායම් අයකිරීම් සම්බන්ධව 2018 දෙසැම්බර් 28 දිනැති අංක 2.104 දරන ගැසට් පත්‍රය මඟින් පලකර තිබුණද කුලී රථ වාහන නවතා තැබීම, අක්කර බදු අයකිරීම හා ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනිම කඩිනම් කිරීම සහ වර්ෂයට අදාළව ගැසට් කරන ලද බදු මුදල් අයකර ගත යුතුවේ. | හිග ආදායම් කපාහැරිමට ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.3.3 වරිපනම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, කළුගඟ හා මොරගහකන්ද මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිසා දියුණු ප්‍රදේශයක් වී ඇති බැවින් නව වරිපනම් තක්සේරු කර වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කර කඩිනමින් වරිපනම් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | අදාළ තොරතුරු පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වමි. |

2.3.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.177,783 ක් වූ හිඟහිටි කුලි ආදායම් (ට්‍රැක්ටර්) නිරවුල් කරගැනිමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි කුලී ආදායම් ශේෂ නිරවුල් කළ යුතුවේ. | හිඟ කුලී මුදල් ඉදිරියේදි අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදි හිඟහිටි කඩ කුලි හා හිඟහිටි නිවාස කුලි වශයෙන් රු.110,430 ක් අයවිය යුතුව තිබුණි. | හිඟහිටි මුදල් කඩිනමින් අයකළ යුතුවේ. | හිඟ කුලී මුදල් ඉදිරියේදි අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.3.5 පරිසර බලපත්‍ර ගාස්තු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | පරිසර බලපත්‍ර ලබාගත යුතු කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන, කුකුළු ගොවිපල, වී මෝල් ඇතුළු ආයතන **72** ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගැනීමට අදාළ සමීක්ෂණයන් සිදුකර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර පරිසර බලපත්‍ර ලබාදීමජාතික පාරිසරික පනත අනුව කළ යුතුවේ. | පෙන්වා දී ඇති කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |

2.3.6 ජල ගාස්තු
--------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු රු.**605,823** ක් ලෙස දක්වා තිබුණ ද අදාළ උපලේඛන සමඟ එහි වෙනස්කම් නිරීක්ෂණය වීමෙන් ජල පරිභෝජන ලේඛනය අනුව බිල් කිරීම්වල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | උපලේඛන සමඟ වෙනස්කම් පරික්ෂා කර ශේෂ නිවැරදි කර ගැනීම හා හිඟ ජල ගාස්තු කඩිනමින් අයකළ යුතුවේ. | ජල ලේඛනයේ සඳහන් ශේෂයන් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ලැබිය යුතු ජල සම්බන්ධතා ගාස්තු ලෙස දක්වා තිබෙන රු.**231,897** ක ශේෂයක් වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු කඩිනමින් අයකළ යුතුවේ. | කඩිනමින් අයකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

2.3.7 වෙනත් ආදායම්
-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රචාරණ දැන්වීම් පුවරුවලින් අයකරගත යුතු ගාස්තු නිර්ණය කරමින් ගැසට් පත්‍රයේ පළ කර ඇතත් ඉන් ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | පෙන්වා දි ඇති දැන්විම් පුවරු වලින් ගාස්තු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.4 අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.362,772 ක වටිනාකමකට වූ අධිභාරයක් පනවා තිබුණි. | අධිභාර වටිනාකම අයකර ගත යුතුවේ. | අයකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 17 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අනෙකුත් කරුණු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවන් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියලු අතුරු ව්‍යවස්ථා පනවා ගෙන සභාවේ කටයුතු කාර්යක්ෂම කළ යුතුවේ. | අදාළ කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිමට ඉදිරියේදි කටයුතු කරන බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි මූල්‍ය ඉලක්කයන් දක්වා නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා මූල්‍ය ඉලක්කයන් ඇතුළත් කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන මසකට ටොන් 03 ක් පමණ වන කසල ප්‍රදේශයේ ඉඩමකට වෙන්කිරීමකින් තොරව බැහැර කර තිබුණු අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව විධිමත් වැඩ පිළිවෙලකට යොමු වීමටත් පොලිතින් අපද්‍රව්‍ය ගිනි තැබීමටත් හා අවිධිමත් බැහැර කිරීම් හේතුවෙන් පරිසරයට හා ජන ජීවිතයට වන බලපෑම අවම කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | කසළ කළමනාකරණය නිසි ලෙස ඉටු කළ යුතුවේ. | කසළ කළමනාකරණය සඳහා අවශ්‍ය ඉඩම් කොටසක් ලබාගැනීමට මහවැලි සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ලගාකර ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දක්වා තිබුණද ඒ සඳහා මූලික ක්‍රියමාර්ග හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ළගාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කැබ් රථ අලුත්වැඩියා වක් සඳහා 2016 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තු වෙන් ලැබී තිබුණු රු.1,343,710 ක මුදල කැබ්රථයේ අලුත්වැඩියා නිසි ලෙස සිදුනොවීම නිසා ගෙවීමට නොහැකි වීමෙන් පොදු තැන්පත් යටතේ දක්වා තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානයේදි එකී මුදල සඳහා ප්‍රතිපාදන සහා අරමුදලේ නොතිබුණි. | කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා ලැබුණු මුදල සහා අරමුදලේ තබාගත යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ සිට පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති රු.79,986 ක් වූ අපදා ණය වාරික මුදල අදාළ නිලධාරියා ස්ථාන මාරු වී ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. | ණය මුදල නිරවුල් කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) | 2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලබාදුන් කොම්පෝස්ට් බඳුන් වලට අදාළව රු.78,270 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තැන්පත් ගිණුමේ ඇති ශේෂය නිරවුල් කළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 15 ක් පැවති අතර මෙම පුරප්පාඩු 15 න් 13 ක්ම ද්විතික මට්ටමේ කාර්යය මණ්ඩලය විය. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුවේ. | පුරප්පාඩු පිළිබඳව ඉහළ පරිපාලනට දන්වා ඇති බව දන්වමි. |
| (ආ) | සභා කාර්යාලයේ සේවය කරනු ලබන මුරකරු 2018 දෙසැම්බර් 30 දින රාජකාරි කටයුතු සඳහා වාර්තා කර ඇති බවට දක්වා තිබුණද, එදින රාත්‍රියේ පෞද්ගලික කාර්යයක් සඳහා පිටව ගොස් තිබියදි තම යතුරු පැදිය අස්ථානගතවී ඇති බවට ලග්ගල පොලිසියේ පැමිණිල්ලක් කර තිබුණි. රාජකාරි කාලය තුළ මුරකරු විසින් රාජකාරිය පැහැර හැරිම සම්බන්ධයෙන් අදාළ මුරකරුට එරෙහිව සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විනය බලධාරි විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | 2013 වර්ෂයේදී වැඩ තහනම් වූ කළමනාකරණ සහාකාර සේවයට අයත් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.128,907 ක ආපදා ණය ශේෂය හා රු.1,000 ක උත්සව අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගැනිමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල කඩිනමින් අයකළ යුතුවේ. | නිවැරදි කරන බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ප්‍රාදේශීය සභාව සතුව පවතින ඉඩම් ගොඩනැගිලි, වාහන හා යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ ඇතුළු වත්කම්, වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලු වත්කම් ලේඛනගත කිරිම කළ යුතුවේ. | සියළු වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | සභාව සතු **WPPF-7381** දරන කැබ් රථය **2019** නොවැම්බර් **23** දින අනතුරකට ලක්ව වාහනය රු.**1,000,000** කට ආසන්න අලුත්වැඩියාවක් කළ යුතු වුවද මේ සම්බන්ධව මු.රෙ **104(3)** පරීක්ෂණ සිදුකොට අලාභයට වගකිව යුත්තන් හදුනාගැනීම සඳහා කඩිනම් පියවර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙන නොතිබුණි. | වගකිව යුත්තන් හදුනා ගැනිම හා අලාභ අයකර ගැනීම මු.රෙ ප්‍රකාරව කළ යුතුවේ. | වගකිව යුත්තන් හදුනාගෙන ඇති බවත් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වමි. |

3.4.3 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබානොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොළ ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ පොදු වැසිකිළි පද්ධතිය පොළ පවත්වන දින වලදි ගාස්තු අයකිරීමකින් තොරව භාවිතයට ලබාදීම නිසා සභාවට ලබාගත හැකි ආදායම් අහිමි වී තිබුණි. | මහා සභා අනුමැතිය ලබාගෙන ගාස්තු අයකළ යුතුවේ. | ගාස්තු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පොළ පවත්වන දිනවලදි එම භූමියේ රථගාල භාවිතා කරන පුද්ගලයන්ගෙන් ගාස්තු අයකිරිමට කටයුතු කර නොතිබුණි. | මහා සභා අනුමැතිය ලබාගෙන ගාස්තු අයකළ යුතුවේ. | ගාස්තු අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොළ භූමියේ පවතින මස් හා මාළු විකුණුම් මධ්‍යස්ථානයේ කඩ කාමර 07 ක් හා ස්ථිර වෙළඳසල් සහිත කඩ කාමර 06 ක් වෙළඳ කටයුතු සඳහා සුදුසු පුද්ගලයන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු පුද්ගලයන්ට ලබාදී සභාවට ආදායමක් ලබාගත යුතුවේ. | ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4.4 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව භාවිතා කරනු ලබන වාහන 05 ක් සභාව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගෙන නොමැති වාහනයද පවරා ගැනිමට කටයුතු කළ යුතුවේ. | WPPF-7381 කැබ් රථය හැර අනෙකුත් සියලුම වාහන සභාව වෙත පවරාගෙන ඇති බව දන්වමි. |

### 3.4.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පවතින වාහන 05 ක් අක්‍රිය තත්වයේ පැවති අතර අලුත්වැඩියා කර භාවිතයට ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කර භාවිතයට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී භාවිතයට ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

### 3.5 ආර්ථික නොවූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ආදායම් බලපත්‍ර නිසි කලට ලබානොගැනීම හේතුවෙන් රු.10,800 ක් දඩ වශයෙන් ගෙවා තිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව දඩ මුදල වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරිම කළ යුතුවේ. | වගකිව යුත්තන් නිශ්චය කර දඩ මුදල් අයකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

3.6 දෘෂ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලග්ගල ප්‍රාදේශීය සභාවට අයත් අංක **WPPF-7381** දරණ කැබ් රථය **2019** නොවැම්බර් **23** දින අනතුරට පත්ව තිබුණු අතර ඊට සම්බන්ධව මෝටර් රථ පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව අදාළ රථයේ තිරිංග නලය වෙන්වන පරිදි යකඩ කපන ආයුධයකින් කපා ඇති බවට දන්වා තිබුණද ඊට සම්බන්ධ වගකිව යුත්තන් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගැනිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වගකිව යුත්තන් හඳුනාගෙන නෛතික ක්‍රියාමාර්ග ගැනිම කළ යුතුවේ. | පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් මේ වන විටත් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව දන්වමි. |

3.7 ප්‍රසම්පාදනය

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **2006** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.2.1** වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ රු.**922,004** ක මිලදී ගැනිම් ප්‍රසම්පාදන සැලැස්මකින් තොරව මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් සකසා ඇත. ඉදිරියේදි ඒ අනුව කටයුතු කරන බව දන්වමි. |

3.7.2 සැපයීම් හා සේවා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කාර්යාලයේ වාහන සඳහා රු.**58,152** ක් වටිනා **90 AMP Exide Ultra** බැටරි **03** ක් මිලදි ගෙන තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **5.6.1(අ)** ප්‍රකාරව විධිමත් පිරිවිතර මඟින් මිල ගණන් කැඳවා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වගකීම් කාලය වැඩි බැටරි **03** ක් මිලදීගත් බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිල කමිටු තිරණය අනුව අවම මිල සහිත භාණ්ඩ මිලදී ගන්නා බවට තිරණය කර තිබුණද අවම මිල වූ **රු.16,900** ක් වූ **90 AMP Exide Power** බැටරිය මිලදී නොගැනිමෙන් **රු.7,452** ක අලාභයක් සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වගකීම් කාලය වැඩි බැටරි **03** ක් මිලදී ගත් බව දන්වමි. |

3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **2019** වර්ෂයේදි ගිවිසුම්ගතව තිබූ **රු.9,000,000** ක වටිනාකමැති සංවර්ධන ව්‍යාපෘති **09** ක් සමාලෝචිත වර්ෂයේදි වැඩ නිමකර නොතිබුණි. | ගිවිසුම්ගත වූ කාලය තුළදීම වැඩ නිමකිරිමට කටයුතු කළ යුතුවේ. | වැඩ අවසන් කර මුදල් පියවීම සඳහා බිල්පත් පළාත් පාලන අමාත්‍යාංශය වෙත යවා ඇති බව දන්වමි. |

3.8 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **1988** ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති **5(7)** ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇතත් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත් කර නොතිබුණු අතර ආයතනයේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ උපදෙස් වාර්තා කිසිවක්ද නිකුත් කර නොතිබීමෙන් ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාකාරි මට්ටමේ නොතිබුණු බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදි අභ්‍යන්තර විගණන වාර්තා ලබාදිමට කටයුතු කරන බව දන්වමි. |

4 **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-----------------------------------------**

**විගණන හා කළමනාකරණ කමිටු**

**---------------------------------------**

| විගණන නිරීක්ෂණය<br>------------------------- | නිර්දේශය<br>---------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>------------------------------ |
|---|---|---|
| මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 අගෝස්තු 01 දිනැති සීපීසී/සීඑම්එස්/10/06 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද 2019 වර්ෂය තුළ කමිටුවාර 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයට අදාළව කමිටු නිසි අයුරින් පැවැත්වීමට කටයුතු කරන බව දන්වමි. |